# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තරිඳු ජයවර්ධන
සමාජය හා සාමයික කේන්ද්‍රය
281,
ඩීන්ස් පාර,
කොළඹ 10

<u>අභියාචක</u>

අභියාචනා අංකය :
**RTIC Appeal Nos. 927/2022, 928/2022, 929/2022**

එදිරිව

ශ්‍රී ලංකා පොලීසිය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී. අභියාචක වෙනුවෙන් නීතිඥ සුරේන් ඩී. පෙරේරා මයා පෙනී සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් සහකාර පොලිස් අධිකාරි (සැපයුම් අංශය) ඒ.පී.ඒ.බී මදනායක මයා (තොරතුරු නිලධාරි), ස්ථානාධිපති (නීති උපදේශ) වසන්ත කුමාර කොටියාකුඹුර මයා සහ ස්ථානාධිපති (මානව හිමිකම් අංශය) එච්.ජී.එස්.පී.කේ චන්ද්‍රසිරි මයා පෙනී සිටී.

**දිනය** : 2022.09.01

ශ්‍රී ලංකා පොලිසියේ තොරතුරු නිලධාරීන් තිදෙනෙකු වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම් සම්බන්ධ අභියාචනා එක්ව විභාග කිරීමට දෙපාර්ශවයම එකඟ වේ. තොරතුරු නිලධාරීන් දෙදෙනෙකු එකිනෙකට වෙනස් ස්ථාවරයන් දක්වා ඇති අතර පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නැත. නම් කළ නිලධාරි වෙත සිදු කරන ලද අභියාචනාවන්ට අදාළව නම් කළ නිලධාරි කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත.

කොමිෂන් සභාවේ පූර්වගාමී තීරණයක් වන අභියාචනා අංක RTIC 832/2022 සහ 833/2022 තීරණයන්හිදී පොදු අධිකාරිය විසින් නිදහස් කිරීමට එකඟ වූ තොරතුරු මෙම තොරතුරු ඉල්ලීමෙහි අංක 01, 02, 04, 05, 06 සහ 07 යන අයිතමයන් සමග සමාන වේ. ඒ අනුව මෙම තොරතුරු ඉල්ලීම් වල අංක 01, 02, 04, 05, 06 සහ 07 යන අයිතමයන්ට අදාළ තොරතුරු නිදහස් කිරීමට පොදු අධිකාරිය එකඟ වේ. එම තොරතුරු 2022.09.10 වන දිනට පෙර ඉදිරිපත් කිරීමටද පොදු අධිකාරිය එකඟ වේ.

අනෙකුත් අයිතමයන්ට අදාළ තොරතුරු ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව පොදු අධිකාරියේ ස්ථාවරය තොරතුරු පනතට අනුකූලව දැක්වීම සඳහා ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට පොදු අධිකාරියට අවස්ථාව ලබා දීමට තීරණය කරමු. ඒ අනුව පොදු අධිකාරියේ ලිඛිත දේශන 2022.09.10 වන දිනට පෙර අභියාචකටද පිටපත් සහිතව, කොමිෂන් සභාවට යොමු කිරීමටත්, ඒ සඳහා වන අභියාචකගේ ප්‍රතිචාරය 2022.09.13 වන දිනට පෙර පොදු අධිකාරියටද පිටපත් සහිතව, කොමිෂන් සභාවට යොමු කිරීමට දෙපාර්ශවය එකඟ වේ.

ඉදිරි අභියාචනා පරීක්ෂණය 2022.10.14 වන දින ප.ව 12.45 ට.

*සටහන් ගැනීම ඕෂධී අදිකාරම් විසිනි.*